චක්‍ර ලේඛ අංක : 10/94

මගේ අංකය:-බ.ප/ස.සේ.කො/රෙ
සමුපකාර සේවක කොමිෂන් සභාව,
(බස්නාහිර පළාත),
මහලේකම් කාර්යාලය - 3 වන මහල
මාලිගාවත්ත - කොළඹ 10.
1994.12.02 වන දින.

බස්නාහිර පළාතේ සියළුම
සමුපකාර සභාපතිවරුන් වෙත.

**කොමිෂන් සභාව සමඟ ලිපි ගණුදෙනු.**

සමුපකාර සමිතිවල සේවයේ යෙදී සිටින සේවක, සේවිකාවන් සිය අවශ්‍යතාවන් සඳහා, කොමිෂන් සභාව වෙත ලියුම් එවීමේදී එවා තම සේවා යෝජක සමුපකාර සමිතියේ ප්‍රධානියා මගින් එවිය යුතු නමුත් සමහර අවස්ථාවන්හිදී එසේ සිදු නොකරන බැව් කොමිෂන් සභාවේ අවධානයට යොමු වී ඇත.

එම නිසා, මින් ඉදිරියට සේවා ප්‍රශ්න සම්බන්ධයෙන් කොමිෂන් සභාවට එවනු ලබන ලිපි සේවා යෝජක සමුපකාර සමිතියේ ප්‍රධානියා මගින් කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතු බව ඔබ සමිතියේ සියළුම සේවකයින්ට දැනුම් දෙන මෙන් කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

03. එවැනි ලියුම් කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමේදී එම ලියුම් වල අඩංගු කරුණු සම්බන්ධයෙන් ඔබගේ නිර්දේශයන්ද අනිවාර්යයෙන් ම සඳහන් කිරීම වැදගත් බව සලකුව මැනවි.

( ඩී.චන්ද්‍රදාස),
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
(බස්නාහිර පළාත).

පිටපත් :- 01. ලේකම් /කෘ.ප.පා.සහ සමුපකාර අමාත්‍යාංශය (බ.ප) - දැනගැනීමට
02. ස.සං.කො/රෙ (බ.ප)
03. ස.සං.කො./රෙ.
04. ලේකම් - සමුපකාර සේවක කොමිෂන් සභාව
05. ප්‍රාදේශීය ලේකම්:- ..................................